ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013/11/01 |

## මූලික උද්ධමනය නොකඩවා පහළ යාමේ නැඹුරුවක

උද්ධමනයේ දිගුකාලීන යටිදැරි උපනතීන් ග්‍රහණය කරනු ලබන මූලික උද්ධමනය, පසුගිය මාස කිහිපයේ දී, ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය යන දෙයාකාරයේම පදනම් මත, නොකඩවා අඩුවන නැඹුරුවක් පෙන්වීය. මූලික උද්ධමනය ගණනය කරනු ලබන්නේ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද. 2006/07=100) භාණ්ඩ පැසෙන්, කෙටිකාලීන මිල උච්චාවචනයන් සහිත අයිතමයන් ඉවත් කිරීමෙනි. ඒ අනුව, වසරේ මුල් මාස දෙකෙහි දී සියයට 7 කට වඩා ඉහළ මට්ටමක පැවති ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2007 වසරේ දී එය හඳුන්වා දෙනු ලැබීමෙන් අනතුරුව වාර්තා වූ අවම අගය කරා ළඟා වෙමින් 2013 ඔක්තෝබර් මස වනවිට සියයට 2.6 දක්වා පහත වැටිණි. මේ අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද, නොකඩවා පස් වැනි මාසයටත් පහළ යමින්, 2013 ජුනි මස දී පැවති සියයට 6.4 ට සාපේක්ෂව 2013 ඔක්තෝබර් මස වනවිට සියයට 5.3 ක් කරා ළඟා විය.




2013 ඔක්තෝබර් මාසයේ දී සියයට 1.4 කින් පමණක් ඉහළ ගිය ආහාර නොවන කාණ්ඩය ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනයේ වේගය අඩු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර නොවන කාණ්ඩයෙහි අධ්‍යාපන (සියයට 0.9); සෞඛ්‍යය (සියයට 0.7); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.7); සහ ප්‍රවාහන (සියයට 0.4) යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ ගියේය. මේ අතර, සන්නිවේදන උප කාණ්ඩයෙහි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

යටිදැරි මූලික උද්ධමනය පහළ මට්ටමක පවත්වා ගැනීමට මහ බැංකුවෙහි විචක්ෂණශීලී ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති හේතු වූ අතර, මූලික උද්ධමනයෙහි දක්නට ලැබුණු හිතකර හැසිරීම තුළින් මෙය මනාව පිළිබිඹු වෙයි. දේශීය ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන්හි දක්නට ලැබෙන හිතකර වර්ධනයන් මෙන්ම ජාත්‍යන්තර වෙළඳ භාණ්ඩයන්හි මිල ඉහළ යාමේ පීඩනයක් නොමැති වීම හේතු කොට ගෙන වසරේ ඉදිරි කාලපරිච්ඡේදයේ දී ද මූලික උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කෙරේ.